www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යාපන අර්ධද්වීපයේ ශ්‍රී ලංකා මිලිටරියේ ආක්‍රමනය පසු බස්වයි

**Sri Lankan military offensive on the Jaffna peninsula pushed back**

**සරත් කුමාර විසිනි**
**2006 ඔක්තෝබර් 13**

බදාදා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය මුහමලෙයි හා කිලාලි අසල දී ඉදිරියට එන හමුදා සේනාංක පසු බැස්වීමත් සමග ම, යාපන අර්ධද්වීපයේ ශ්‍රී ලංකා මිලිටරියේ අසාර්ථක වූ ආක්‍රමනික මෙහෙයුම ආන්ඩුවේ පාර්ශ්වයට දැවැන්ත ජීවිත හානි ඇති කර තිබේ. ජෙට් ප්‍රහාරක යානාවල හා නාවික ප්‍රහාරක බෝට්ටුවල සහාය ලද ගොඩබිම් ප්‍රහාරවල ඉල්ලය වූයේ අර්ධද්වීපයේ දකුනේ ප්‍රධාන එල්ටීටීඊ මධ්‍යස්ථාන අල්ලා ගැනීම යි.

පසු ගිය මාස තුන තිස්සේ ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර ප්‍රදේශවල ආන්ඩුව ගෙන ගිය සෙසු ආක්‍රමනික මෙහෙයුම්වල දී මෙන් ම, මෙහි දී ද මිලිටරිය කියාපෑවේ සිය ක්‍රියාවන් මුලුමනින් ම ආරක්ෂක පියවර වූ බව යි. හමුදාව දැවැන්ත එල්ටීටීඊ ප්‍රහාරයක් සාර්ථකව මැඩ පවත්වා ඔවුන්ගේ සටන්කරුවන් සිය ගනනක් මරා දැමීමට සමත්ව ඇතැයි ආරක්ෂක ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ මාධ්‍යවලට පැවසී ය. ඔහු ආරම්භයේ දී කියා සිටියේ ආන්ඩුවේ හමුදාවන්ගෙන් 22ක් පමනක් මිය ගොස් 110කට වැඩි සොල්දාදුවන් පිරිසකට තුවාල සිදුව ඇති බව යි.

එම කතාව ඉක්මනින් ම කීතු වී ගියේ ය. සොල්දාදුවන් 55ක මල සිරුරු සොයා ගෙන, තවත් 78ක් අතුරුදහන්ව 283කට තුවාල ලබා ඇතැයි, බ්‍රහස්පතින්දා හැන්දෑවේ සමරසිංහ පිලිගත්තේ ය. තමන් හමුදාවේ ප්‍රධාන ආක්‍රමනික මෙහෙයුමක් පරාජයට පත් කොට 200කට අධික භටයන් පිරිසක් මරා දමා ඇතැයි එල්ටීටීඊය කල කියාපෑම් සමග මෙම නව සංඛ්‍යා වඩා සමීපව ගැලපුනි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (අයිසීආර්සී) හරහා සොල්දාදුවන් 75කගේ මල සිරුරු භාර දීමට එල්ටීටීඊය සූදානම් වන බව ද සමරසිංහ පිලිගත්තේ ය. ඔහු මෙම ප්‍රකට කරුන පැහැදිලි කලේ නැත: එනම් මිලිටරිය "ආරක්ෂක" මෙහෙයුමක නිරත වූයේ නම් එල්ටීටීඊය සිය භූමි ප්‍රදේශවල සිට මල සිරුරු භාර දෙන්නේ ඇයි? එල්ටීටීඊය සමන්ත වීරසිංහ නම් වූ 18 හැවිරිදි සොල්දාදුවකු ද අල්ලා ගෙන ඇත.

2002 සටන් විරාම ගිවිසුම අධීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) මාධ්‍යවලට මෙසේ අදහස් දැක්වී ය: "කොටි, සොල්දාදුවන්ගේ මල සිරුරු 75ක් සොයා ගෙන ඇත්නම්, එයින් යෝජනා කෙරෙන්නේ හමුදාව කැරලිකරුවන්ගේ අනතුරු ඇඟවීම් නොතකා කැරලිකරුවන්ගේ ප්‍රදේශ තුලට නව මෙහෙයුමක් සිදු කොට ඇති බව යි."

සියලු ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් ගත හොත්, මිලිටරි සංස්ථාපිතය තුල පවතින මනෝගතිය සංශයවාදී ය. ඒඑෆ්පී ප්‍රවෘත්ති සේවය ඉහල පෙලේ ආරක්ෂක මූලාශ්‍රයක් මෙසේ පවසනු උපුටා දැක්වී ය: "හමුදාවට හොම්බ තැලෙන්න වැදුනු බවට සැකයක් නැහැ. . . . එය විශාල අත්වැරදීමක් තියුනු ප්‍රතිරෝධයකට මුහුන දීමෙන් පසුව සිය මෙහෙයුම අතහැර දැමීමට හමුදාවට බල කෙරුනේ යැයි පැවසූ ඉහල පෙලේ මිලිටරි මූලාශ්‍රයක් තවත් වාර්තාවක උපුටා දක්වා තිබුනි.

ආන්ඩුවේ උත්සුකතාව පිලිබඳ තවත් දර්ශකයක් වූයේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ "සොල්දාදුවන්ගේ අවශ්‍යතා ගැන සොයා බලා පිලියම් යෙදීමට සියලු රෝහල්වලට යන ලෙස ඇමතිවරුන්ට" උපදෙස් දී ඇතැයි යනුවෙන් ඒඑෆ්පී වාර්තාවක කල සඳහනයි.

ජුලි මස නැගෙනහිර පලාතේ මාවිල්ආරු ප්‍රදේශයේ එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශයට සිය පලමු ආක්‍රමනික මෙහෙයුම දියත් කල අවස්ථාවේ පටන් මේ දක්වා ම, මිලිටරිය සටන් පිලිබඳ වාර්තා වාරනය කිරීමට උත්සාහ කර ඇත. කෙසේ වෙතත්, ජීවිත හානි අනවරතයෙන් ඉහල නගින තතු තුල යලි යුද්ධය ඇවිලවීම හමුදාව තුල අසහනකාරී තත්වයක් නිර්මානය කරන බවට සලකුනු වැඩෙමින් පවතී.

සිකුරාදා, හමුදාව නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්කර්නිහි එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ අල්ලා ගැනීමට තවත් ප්‍රධාන ආක්‍රමනික මෙහෙයුමක් දියත් කලේ ය. එම මෙහෙයුමේ දී භටයන් 12ක් පමන මරනයට පත් වුනි. අල්ලා ගැනුනු සොල්දාදුවකු වූ

ආර්.එම්.එස්. රත්නායක එස්එල්එම්එම් නිලධාරින්ට කියා සිටියේ, එල්ටීටීඊයේ බිඳී ගිය කන්ඩායමක් වන පැරා-මිලිටරි කරුනා කන්ඩායමේ සටන්කරුවන් 80ක් සමග 300ක ආන්ඩුවේ භට පිරිසක් මෙහෙයුමට සහභාගි වූ බව යි. කරුනා කන්ඩායම හෝ වෙනත් දෙමල පැරා-මිලිටරි කන්ඩායම් සමග කිසිදු සම්බන්ධයක් නැතැයි ආරක්ෂක ප්‍රකාශක නැවත නැවතත් පවසා ඇත.

යාපන අර්ධද්වීපයේ මෑතම මෙහෙයුමේ අරමුන පැහැදිලි ය. 2000 දී, රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධය තුල දී ප්‍රථම වතාවට එල්ටීටීඊය අලිමංකඩ හමුදා කඳවුර අල්ලා ගැනීමෙන්, මිලිටරිය බරපතල පරාජයක් ලැබී ය. එම කඳවුර අර්ධද්වීපයට ඇතුලු වන ප්‍රධාන මූලෝපායික මාර්ගයකි. එය අල්ලා ගැනීමෙන්, යාපන නගරය හා අර්ධද්වීපයේ උතුරේ පිහිටි ප්‍රධාන මිලිටරි මධ්‍යස්ථාන දෙසට ඉක්මනින් ම ඉදිරියට යාමට එල්ටීටීඊ සටන්කරුවන්ට අවස්ථාව ලැබුනි. හමුදාව මේ සතියේ අසාර්ථක මෙහෙයුම දියත් කලේ අලිමංකඩ යලි අල්ලා ගැනීමේ උත්සාහයක් ලෙස ය.

ජිනීවා නුවර ඔක්තෝබර් 28-29 දිනවල පැවැත්වීමට නියමිත සාම සාකච්ඡා මගින් ගැටුම අවසන් කර ගැනීමේ උත්සාහයක තමන් යෙදී ඇති බවට ආන්ඩුව කරන කියාපෑම්, මෙම මෙහෙයුම මගින් විහිලුවක් බවට පත් කෙරෙයි. මිලිටරිය මුහමලෙයි අසල භටයන් හා යුද ටැංකි රැස් කිරීමේ යෙදී සිටින බව, අගහරුවාදා නෝර්වේජියානු තානාපති හැන්ස් බ්‍රැට්ස්කර් සමග ජිනීවා කතා පිලිබඳව සිදු කල සාකච්ඡාව තුල දී, එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක එස්.පී. තමිල්චෙල්වම් පැමිනිලි කලේ ය. හමුදාව සිය ප්‍රකෝපකාරි ප්‍රහාරය ඉදිරියට ගෙන ගිය හොත් සාකච්ඡාවලට සහභාගි වීම ගැන යලි සලකා බැලීමට එල්ටීටීඊයට සිදු වනු ඇතැයි ඔහු අනතුරු ඇඟවී ය.

සඳුදා එක්සත් ජනපද, යුරෝපා සංගම්, ජපාන හා නෝර්වේ තානාපතිවරුන්ට කතා කරමින්, ජනාධිපති රාජපක්ෂ යලි කියා සිටියේ, ආන්ඩුව සාකච්ඡාමය විසඳුමකට කැප වී සිටින අතර එහෙත් "ආරක්ෂාව තහවුරු කිරීමට සුදුසු ප්‍රති පියවර ගැනීමට බල කෙරෙනු " ඇති බව ය. මේ වන තෙක් සෑම හමුදා මෙහෙයුමක් ම "ආරක්ෂක" පියවර වී ඇතැයි යන කරුන ගත් කල, රාජපක්ෂගේ වචනවල කිසිදු වටිනාකමක් නැත. සද් චේතනාවෙන් සාකච්ඡාවල යෙදීමේ කිසිදු අභිප්‍රායක් ආන්ඩුවට නැති බවට මේ සතියේ මෙහෙයුම තවත් එක් සලකුනකි.

මෙහෙයුමේ අරමුන වන්නේ ආන්ඩුවේ සාකච්ඡාකරුවන්ගේ අත් ශක්තිමත් කොට සැලකිය යුතු සහන දීමට එල්ටීටීඊයට බල කිරීම යි. ආන්ඩුව සමග ඉහල පෙලේ සාකච්ඡාවල යෙදෙන මිලිටරි නායකයන් සාම සාකච්ඡාවල දී තදබල ආස්ථානයක් ගත යුතු යැයි අවධාරනය කරන බව, පසු ගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයේ "තත්ව වාර්තාව" එලිදරව් කලේ ය. "මිලිටරියේ ජයග්‍රහන ආරක්ෂා කර ගත යුතු අතර ජාතික ආරක්ෂක අවශ්‍යතා තව දුරටත් අනතුරේ හෙලීමට ගරිල්ලාවරුන්ට කිසිදු අවස්ථාවක් නොදිය යුතු ය යන අදහස මිලිටරියේ ඉහල නිලධාරිහු දැඩිව දරා සිටියහ. එල්ටීටීඊය බලාපොරොත්තු වන්නේ යලි සංවිධානය වීමට හා යලි සන්නද්ධ වීමට කාලය ලබා ගෙන තව දුර තර්ජන එල්ල කිරීමට යැයි ඔවුහු අවධාරනය කලහ." යැයි එම තීරු ලිපිය සඳහන් කලේ ය.

ඔක්තෝබර් 3 දා නෝර්වේජියානු තානාපති බ්‍රැට්ස්කර් හා විශේෂ නියෝජිත ජෝන් හැන්සන් බවර් සමග පැවති සාකච්ඡාවල දී, යුද හමුදාපති සරත් ෆොන්සේකා ප්‍රකාශ කලේ, මිලිටරිය තමන්ට සුදුසු යැයි සිතෙන ඕනෑම අවස්ථාවක එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනික පියවර ගන්නා බවට යි. "මිලිටරිය සම්බන්ධයෙන් ගත හොත්, ඔවුහු ත්‍රස්තවාදී ප්‍රහාර ගෙන යාමට එල්ටීටීඊයට පවත්නා හැකියාව මොට කරනු සඳහා අවශ්‍ය තන්හි දී පූර්ව-භංග ප්‍රහාර සිදු කරනු ඇත." එල්ටීටීඊය දුර්වල වී ඇති බවත් ඔවුන්ට "නව ජීවන හුස්මක්" දීමට මිලිටරිය සූදානම් නැති බවත් ෆොන්සේකා පැවසී ය.

මේ සතියේ දී මිලිටරිය පසු බැස්වීමට සමත් වීම ජිනීවා සාම සාකච්ඡාවල දී තමන්ට වඩා හොඳ තත්වයක් ලබා දෙනු ඇතැයි එල්ටීටීඊය බලාපොරොත්තු වන බවට සැකයක් නැත. එල්ටීටීඊ ප්‍රකාශක රාසයියා ඉලන්තිරෙයියාන් ඊයේ මෙසේ ප්‍රකාශ කලේ ය: "එල්ටීටීඊ භූමි ප්‍රදේශ තුල ශ්‍රී ලංකා හමුදාව සිදු කල මෙහෙයුම ජාත්‍යන්තර ප්‍රජාවගේ බලාපොරොත්තු නොසලකා හරින අතර ප්‍රචන්ඩ ක්‍රියා අතහැර සාකච්ඡාවල නිරත වන ලෙස සම-සභාපතිවරු කල ඉල්ලීම පසෙකට තල්ලු කර දමයි." එය වනාහි බලය බෙදා ගැනීමේ එකගතාවකට පැමිනෙන ලෙස රාජපක්ෂ ආන්ඩුවට බල කරන ලෙස මහ බලවතුන්ට කරන තවත් නිෂ්පල ආයාචනයකි.

ආන්ඩුවේ අසාර්ථක මෙහෙයුම මධ්‍යයේ, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක සීන් මැක්කොමැක්, සාම සාකච්ඡා සාදරයේ පිලිගනිමින් එහෙත් "ශ්‍රී ලංකාවේ දැන් සිදු වන ප්‍රචන්ඩ ක්‍රියා එකගතාව අවදානමේ හෙලීම ගැන" එක්සත් ජනපදය "ගැඹුරින් ම උත්සුක වන" බව ප්‍රකාශ කරමින් නිවේදනයක් නිකුත් කිරීම අර්ථභාරී ය. සාමය ගැන අව්‍යාජ ලෙස උත්සුක වනවා වෙනුවට, වොෂිංටනය එල්ටීටීඊයට එරෙහිව යලි යුද්ධය ඇවිලවීමේ රාජපක්ෂ ආන්ඩුවේ පිලිවෙතට වක්‍රව පිටුබලය සපයා ඇත. එහි එකම උත්සුකතාව පවතින්නේ මෙහෙයුම සැලසුම් කල ආකාරයට සිදු නොවීම ගැන ය.

පසු ගිය සතියේ දී 2007 සඳහා අයවැය ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කල විට ආන්ඩුවේ සැබෑ සැලසුම් එලිදරව් විය. ඊලග වසර සඳහා මිලිටරි වියදම් රුපියල් බිලියන 96 සිට රුපියල් බිලියන 139.6 දක්වා සියයට 45කින් ඉහල දැමීමට යෝජනා කෙරේ. යුද්ධය උත්සන්න කිරීමෙන් පසුව මේ වසර සඳහා ආරක්ෂක වියදම් රුපියල් බිලියන 76 සිට රුපියල් බිලියන 96 දක්වා දැනටමත් ඉහල දමා තිබේ.

රැකියා හා අත්‍යවශ්‍ය සේවා කප්පාදුව මෙන් ම ඉහල යන මරන සංඛ්‍යාව හරහා සාමාන්‍ය වැඩ කරන ජනතාවට රාජපක්ෂගේ යුද්ධයේ බර දැරීමට බල කෙරෙනු ඇති බවට කිසිදු සැකයක් නැත.

© www.wsws.org